සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

වැඩමෙල් මාකාණක් කලවිත් තිණෙක්කළුම්

64	T	I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2018

First Term Test - Grade 10 - 2018

முதலாம் தவணைப் பரீட்சை - தரம் 10 - 2018

சுட்டிலக்கம் .....

දෙවන බස - සිංහල I
இரண்டாம் மொழி - சிங்களம் I
Second Language - Sinhala I

நேரம் : 1 மணித்தியாலம்

සැලකිය යුතුයි :

(i) සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අකුරෙන් ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැපයෙන කවය තුළ (*x*) ලකුණ දෙන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

கவனிக்க :

(i) எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.

(ii) 1 தொடக்கம் 40 வரையுள்ள வினாக்கள் ஒவ்வொன்றிலும் (1) (2) (3) (4) என எண்ணிடப்பட்ட விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.

(iii) உமக்கு வழங்கப்பட்டுள்ள விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் உரிய வட்டங்களில் உமது விடையின் எண்ணை ஒத்த வட்டத்தினுள்ளே புள்ளடியை (*x*) இடுக.

(iv) அவ்விடைத்தாளின் மறுபக்கத்தில் தரப்பட்டுள்ள மற்றைய அறிவுறுத்தல்களையும் கவனமாக வாசித்துப் பின்பற்றுக.

Note :

(i) Answer all questions.

*(ii) In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which you consider is **correct or most appropriate.***

*(iii) **Mark a cross (x) on the number corresponding to your choice in the answer sheet.***

(iv) Further instructions are given on the back of the answer sheet. Follow them carefully.

- **අංක** 1 **සිට** 5 **තෙක් ප්‍රශ්නවල** තද කළු අකුරෙන් **මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පදය තෝරන්න.**

1 தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொல்லுக்குப்/ **சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொல்லைத் தெரிவு செய்க.**

***Select the most suitable word for the words printed in thick bold letters in questions no.* 1 to 5.**

01. **ඔයාලාට ජයග්ග්‍රහණය කරන්න පුළුවන්.**
1. ජය අක්ග්‍රහණය **2. ජයග්‍රහණය** **3. ජයගහණය** **4. ජය ගහණය**

02. **උස්සාහය අත්හරින්න එපා.**
1. උත්සහය **2. උත්සාහය** **3. උස්සහාය** **4. උත්සවය**

03. **පොත්වලින් කියෝලත් තියනවා.**
1. කියවලොත් **2. කියවලත්** **3. කියවත්** **4. කියවලත්**

04. **දවස් දෙකකින් බෙහෙත් දාන්න නැවතෙන්න.**
1. නැවැත් එන්න **2. නැවත එන්න** **3. නැවත් වෙන්න** **4. නැවැත්තෙන්න**

05. **ළමයාට බෙහෙත් පෙති දෙකක් දෙන්නෝනෑ.**
1. දෙන්ඕන **2. දෙන්න ඕනෑ** **3. දෙන්නෑ** **4. දෙන්නේ නෑ**

- අංක 6 සිට 10 තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරෙන් නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.
  6 තොටක්කම් 10 වරෙයාන විනාක්කළිල් තරප්පට්ටුළ්ළ සොර්කළිල් සරියාන උච්චරිප්පෙයිත් තරුම් සොල්ලෙ තෙරිවු සෙය්ක.
  *Select the word with **correct pronunciation** out of the words given in questions no. **6** to **10**.*

06. 1. සෙනෙහස 2. සැනෙහස 3. සෙනැහස 4. සැනහස

07. 1. වෙඩැට 2. වෙඩට 3. වැඩට 4. වැඩෙට

08. 1. දියනවා 2. තියැනව 3. දියැනවා 4. තියනවා

09. 1. පෙට්ඩක් 2. බොඩ්ඩක් 3. පොඩ්ඩක් 4. බොට්ඩක්

10. 1. එවෙල්ලා 2. එවිල්ලා 3. ඇවෙල්ලා 4. ඇවිල්ලා

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශය සඳහා වඩාත් ගැළපෙන ප්‍රශ්නය තෝරන්න.
  11 තොටක්කම් 14 වරෙයාන ඔව්වොරු කූට්‍රුක්කුම් මිකප්පොරුත්තමාන විනාවිනෙත් තෙරිවු සෙය්ක.
  *Select the **most appropriate** interrogative question for the given sentence in questions no. **11** to **14**.*

11. ගොක් කොළවලින් නෙළුම් මලක් හදනවා.
  1. නෙළුම් මල හදන්නේ මොකටද?
  2. නෙළුම් මල හදන්නේ කොතනද?
  3. නෙළුම් මල හදන්නේ කවුද?
  4. නෙළුම් මල හදන්නේ මොනවාගෙන්ද?

12. විදුහල්පතිතුමා අපිට සුබ පැතුවා.
  1. ඔයාලාට සුබපැතුවේ කවුද?
  2. ඔයාලාට සුබපැතුවේ ඇයි?
  3. ඔයාලාට සුබපැතුවේ මොකටද ?
  4. ඔයාලාට සුබ පැතුවේ කවදාද?

13. තාත්තා නුවරට මාරු කරලා.
  1. තාත්තා මාරු කළේ ඇයි?
  2. තාත්තා මාරු කළේ කවදාද?
  3. තාත්තා මාරු කළේ කොහාටද?
  4. තාත්තා මාරු කළේ මොකෙන්ද?

14. මගේ අත දිහා බලන්න.
  1. බලන්න කීවේ මොකෙන්ද?
  2. බලන්න කීවේ මොකක් දිහාද?
  3. බලන්න කීවේ කවුද?
  4. බලන්න කීවේ කාටද?

- අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදිව අකුරු යෙදී ඇති පදය තෝරන්න.
  15 තොටක්කම් 17 වරෙයාන විනාක්කළිල් සරියාන එළුත්තුක්කළෙක් කොණ්ඩ සොල්ලෙත් තෙරිවු සෙය්ක.
  *Select the word with **correct spelling** in questions no. **15** to **17**.*

15. 1. පොලොන්නරුව 2. පොළොන්ණරුව 3. පොළොන්නරුව 4. පොලොන්ණරුව

16. 1. අවශ්‍යතාවය 2. අවස්‍යතාවය 3. අවෂ්‍යතාවය 4. අවශ්‍යථාවය

17. 1. කොළඹ 2. කොළඹ 3. කොලඹ 4. කොළඹ

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
  18 තොටක්කම් 20 වරෙයාන විනාක්කළිල් පොරුත්තමට්‍ර සොල්ලෙත් තෙරිවු සෙය්ක.
  *Select the **inappropriate** word in questions no. **18** to **20**.*

18. 1. කරවිල 2. කැකිරි 3. ගෝවා 4. කරවල

19. 1. ඉස්ලාම් 2. කතෝලික 3. බෞද්ධ 4. මුස්ලිම්

20. 1. ගවුම 2. සාරිය 3. කමිසය 4. හැට්ටය

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  21 தொடக்கம் 23 வரையான வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு ஒத்தகருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
  *Select the **synonym** for the initially given word in questions no. **21** to **23**.*

21. පැත්තට : 1. නමට 2. දෙසට 3. දේශයට 4. ගම

22. සෑදීම : 1. සැලසීම 2. කෑම 3. සැකසීම 4. සැනසීම


23. දවස : 1. කළය 2. දිනය 3. කරල 4. දානය

- අංක 24 සිට 25 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
  24 மற்றும் 25 ஆகிய வினாக்களுக்காக ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு எதிர்கருத்தைத் தரும் சொல்லைத் தெரிவு செய்க.
  *Select the **antonym** for the initially given word in questions no. **24** to **25**.*

24. නගරය : 1. ගඟ 2. ගමන 3. ගම 4. ගුවන

25. හොඳින් : 1. අමාරුවෙන් 2. නරකින් 3. හිමින් 4. ටිකකින්

- අංක 26 සිට 28 තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
  26 தொடக்கம் 28 வரையான ஒவ்வவொரு வினாவிலும் தரப்பட்ட படங்களுக்கான மிகப் பொருத்தமான கூற்றைத் தெரிவு செய்க.
  *Select the **most suitable statement** for the picture given in each questions no. **26** to **28**.*

26. 

1. වටරවුම් මාර්ගයකි.
2. ඉදිරියෙන් මාර්ගය ඉඩදෙනු.
3. මාර්ගයේ සීමාවක් නැත.
4. ඉදිරියට ගමන් කිරීම තහනම්.

27. 

1. ජංගම දුරකථනය ක්‍රියා කරවන්න.
2. ජංගම දුරකථනය භාවිතා කිරීම තහනම්.
3. ජංගම දුරකථනය මෙතනින් තබන්න.
4. ජංගම දුරකථනය නොතබන්න.

28. 

1. වාහන දෙකකට යා හැකිය.
2. ගමන් කළ හැක්කේ ඉදිරියටයි.
3. පිටුපසුට යන්න එපා.
4. වාහන ඉස්සර කිරීම තහනම්.

- අංක 29 සහ 30 ප්‍රශ්නවලට ගැළපෙන උත්තරය තෝරන්න.
  29 மற்றும் 30 ஆம் வினாக்களுக்குப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.
  *Select **suitable answer** for questions no. **29** and **30**.*

29. අනිද්දා බදාදානම් අද කවදාද
1. අඟහරුවාදා 2. සඳුදා 3. ඉරිදා 4. සෙනසුරාදා

30. පහත සඳහන් පද අතුරින් ඒක වචන ක්‍රියාපදයක් නොවන්නේ.
1. කළහ 2. කරයි 3. යයි 4. නටන්නේය

- අංක 31 සහ 32 යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක සම්බන්ධ කර එක් වාක්‍යයක් ලෙස නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.
  31 **மற்றும்** 32 **ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும்** இணைத்து ஒரு வாக்கியமாக்கி சரியாக எழுதப்பட்ட வாக்கியத்தைத் தெரிவு செய்க.
  Select the Two sentences are given in each questions no. **31** and **32**. Select the **correct sentence** that combined both separate sentences.

31. මම අලුත් පාසලට යනවා. මම හොඳට ඉගෙන ගන්නවා.
1. මම හොඳට ඉගෙන ගෙන අලුත් පාසලට යනවා.
2. මම අලුත් පාසලේ ඉගෙන ගන්නවා.
3. මම හොඳට ඉගෙන ගන්නේ අලුත් පාසලේ.
4. මම අලුත් පාසලට ගිහින් හොඳට ඉගෙන ගන්නවා.

32. පුතා මෙහෙ බලන්න පුතා ඇස් දෙක පියා ගන්න.
1. පුතා මෙහෙ නොබලා ඇසි පියා ගන්න.
2. පුතා මෙහෙ බලා ගෙන ඇස් දෙකපියා ගන්න.
3. පුතා ඇසදෙක පියාගෙන මෙහෙ බලන්න එපා.
4. පුතා ඇස්දෙක පියා ගන්න මෙහෙ බලන්න.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු පදය** තෝරන්න.
33 **මත්‍රුම්** 34 **ஆகிய வினாக்களில் கீறிட்ட இடங்களுக்கு** மිකවුම් පොරුත්තමාන සොල්ලෙත් **තෙරිවු** සෙය්ක.
*Select the **most suitable word** for filing the blanks in questions no. **33** and **34**.*

33. සර් අර උඩ ..... කමල්.
1. ඉන්නවා 2. ඉන්න 3. ඉන්නේ 4. ඉදිමී

34. අපේ ..... ක්‍රීඩා උත්සවට සිකුරාදා
1. පාසල් 2. පාසල 3. පාසලේ 4. පාසලට

- අංක 35 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.
35 ஆவது வினாவிற்கு விடையளிக்க.
Answer question no. **35**.

35. ශ්‍රී ලංකාවට නිදහස් ලැබුණේ 1948 දීය.
1. එක්දහස් නවසිය හතළිස් අට. 2. දහනවයයි හතළිස් අට.
3. එකයි නවයයි හතළිස් අට. 4. එකසිය අනු හතරයි අට.

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවල ව්‍යාකරණනුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.
36 තොටක්කම් 40 වරෙයාන විනාක්කළිල් ඉලක්කණ රීතියාක සරියාන වාක්කියත්තෙත් තෙරිවු සෙය්ක.
*Select the **grammatically correct** sentence in questions from **36** to **40**.*

36. 1. තාත්තාට ලියුමක් ලැබෙති
2. තාත්තාට ලියුමක් ලැබෙමි.
3. තාත්තාට ලියුමක් ලැබුණේය.
4. තාත්තාට ලියුමක් ලැබුණෝය.

37. 1. කම්කරුවෝ වැඩ කරයි.
2. කම්කරුවෝ වැඩ කරති.
3. කම්කරුවන් වැඩ කරයි.
4. කම්කරුවන් වැඩ කරති.

38. 1. ගස් සුළඟට බිමට වැටෙති.
2. ගස් සුළඟට බිමට වැටෙයි.
3. ගස් සුළඟට බිමට වැටෙන්නීය.
4. ගස් සුළඟට බිමට වැටෙන්නෝය.

39. 1. මම රචනාවක් ලියනවා.
2. මම රචනාවන් ලියමු
3. මම රචනාවක් ලියති.
4. මම රචනාවක් ලියමි.

40. 1. ඇත් රංචුව වනයේ සැරිසරන්නේය.
2. ඇත් රංචුව වනයේ සැරිසරති.
3. ඇත් රංචුව වනයේ සැරිසරන්නීය.
4. ඇත් රංචුව වනයේ සැරිසරයි.

සියලු හිමිකම් ඇවිරිණි/ All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

(උ) නවීන තාක්ෂණය
1. හැඳින්වීම
2. නවීන තාක්ෂණය ඇති වූ ආකාරය
3. එමගින් ලැබුණු යහපත් ප්‍රතිඵල
4. එමගින් සිදු වී අයහපත
5. සමාලෝචනය

(ලකුණු - 20 යි.)

02. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරින් වාක්‍ය පහක් ගොඩනගන්න. (වාක්‍යයක අවම වශයෙන් වචන 4 ක් වත් තිබිය යුතුය)
පින්වරුම් පටත්තෙ අඩිප්පටෙයාකක් කොණ්ඩු ඉන්දු කරුත්තුල්ල වාක්කියංකළ් එළුතුක. (ඔරු වාක්කියත්තිල් නාන්කු චොර්කළුක්කු කුරෙයාමල් ඉරුත්තල් වේණ්ටුම්)
Compose five meaningful sentences with reference to the given picture. (There should be four words minimally in a sentence)



(ලකුණු - 10 යි)

II කොටස / பகுதி II / Part II

- 3, 4 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.
3, 4 ஆம் வினாக்களுள் ஒன்றுக்கு மட்டும் விடை எழுதுக.
Answer only one question from questions 3 and 4.

03. පහත සඳහන් ගීතය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
පින්වරුම් පාටලෙ වාසිත්තු අතන් කීළ් තරප්පට්ටුළ්ළ විනාක්කළුක්කු විටෙ එළුතුක.
Answer the given questions with reference to the following song.

උදෑසනම පොඩි අපි දුව යනවා
කොහේ ද සැඟවී එළියට එනවා
උදේ පාන්දර පාසල් යන්නට
බසයක් ඇවිදින් කතා කරනවා

මේ පොඩි බස් රිය ඔබේ ය හිතලා
කුරුටු ගෑම හොඳ නෑ ඉරි ඇඳලා
අසුන් කඩා බිඳ දමා නොයන්නේ
ඔබේ ය මේ බස් රිය රැක ගන්නේ

ගල් වැලි ගසලා මුව පොඩි කරලා
එපා පුංචි ළමයිනි පොර කන්නට
පේළි ගැසි බසයක නැඟ ගත් විට
මුතු ඇමුණුව වාගෙයි මුතු පොටකට

01. උදේ පාන්දර ඇවිදින් කතා කරන්නේ කුමක්ද?
02. බස්රියට නොකළ යුතු දේවල් දෙකක් ලියන්න.
03. පොරකන්න එපා කියන්නේ කාටද?
04. ළමයි පේළියට බසයට නගින විට පේන්නේ කුමක් ලෙසද?
05. පහත සඳහන් පදවලට සමාන පද ගීතයෙන් තෝරා ලියන්න.
1. පෝලිම් 2. ආසන (ලකුණු - 2 x 5 = 10 යි.)

04. පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
පින්වරුම් උරෙප්පකුතියෙ වාසිත්තු ඉතන් කීළ් තරප්පට්ටුළ්ළ විනාක්කළුක්කු විටෙ එළුතුක.
Answer the given questions with reference to the following prose text.

ගමේ ඇත කොනක පිහිටි පුංචි මැටි ගෙයකි. එහි ජීවත් වුයේ විමල් සහ ඔහුගේ නැගණියයි. දෙමවුපියන් නැති ඔවුන් සිටියේ ආත්තම්මා සමඟයි. ඈ ඔවුන් ආදරයෙන් රැක බලා ගත්තා ය. ආත්තම්මා ජීවිකාව ගෙන ගියේ පොල් අතු විවීමෙන් කොහු ඇඹරීමෙන් සහ එළවළු කොරටුවෙන් ලැබුණු ආදායමෙනි.

විමල් සහ සාමා ඉගෙන ගැනීමට දක්ෂයෝ වුහ. ඔවුන් ජීවත් වූ පුංචි පැලට යාබදව විශාල දෙමහල් මැදුරක් පිහිටා තිබුණි. එහි ජීවත් වුණේ කවුරුන් දැයි පුංචි මැටි පැලේ පොඩිත්තන් දැන සිටියේ නැත. ඔවුන්ගේ පැලට පෙනුණේ විශාල මැදුරේ වහලය පමණි. එයට හේතුව එම මන්දිරය වටා උස ශක්තිමත් තාප්පයක් බැඳ තිබීම ය. කෙනෙකු තාප්පය උඩින් පැනීම වැළැක්වීම පිණිස තාප්පය උඩ බෝතල් කටු සවිකර තිබුණි.

මේ නිසොල්මන් දැවැන්න මහා මන්දිරය අසල උපන් දා සිට ජීවත් වුණු පොඩිත්තන්ට පෙනුනේ එය ගසක් ගලක් හෝ යෝධ කන්දක් වගෙයි. ඒ ගෙන සොයා බලන්නට තරම් ආශාවක් ඔහුන්ට කිසි දිනෙක ඇති වුණේ නැත.

1. ළමයි ජීවත් වූ ගෙය කෙබදු එකක්ද?
2. මෙහි සඳහන් ළමයි දෙදෙනාගේ නම් ලියන්න.
3. ළමයි බලා ගත්තේ කවුද?
4. ළමයින්ගේ නිවසටයාබදව තිබුණේ කුමක්ද?
5. පහත සඳහන් පදවලට සමාන පද ඡේදයෙන් තෝරා ලියන්න.
   1. මැදුර 2. වෘක්ෂය

(ලකුණු 10යි)

III කොටස / பகுதி III / Part III

- 5 හා 6 ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.
5 மற்றும் 6 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.
Answer both questions 5 and 6.

05. අධ්‍යාපන චාරිකාවක් යාම සඳහා මුදල් ලබා දෙන ලෙස ඉල්ලා විදේශගත වී සිටින ඔබේ පියාට යැවීමට සුදුසු පෞද්ගලික ලිපියක් සකස් කරන්න. (ඔබ කැමති නම් ගම් යොදා ගන්න.)

තරප්පට්ට විටයඞ්කළෙ උළ්ළටක්කි කටිතම් ඔන්රු එළුතුක.
Writing a letter according to the given guide lines.

(ලකුණු - 2 x 5 = 10යි)

නැතහෝත්

ඔබ ව/ඉ/ හමීදියා මුස්ලීම් මහා විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවක්/ ශිෂ්‍යයෙක් යැයි සිතන්න. ඔබේ පන්තියේ සිසුන්ගේ චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමට නියමිත බැවින් 2018.04.03 දින පෙ.ව. 10.30 ට පාසලේ ප්‍රධාන ශාලාවට පැමිණෙන ලෙස ඉල්ලා විදුහල්පතිතුමාට ආරාධනා කිරීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

තරප්පට්ට විටයඞ්කළෙ උළ්ළටක්කි අළෙප්පිතළ් ඔන්රු එළුතුක.
Writing an invitation card according to the given guide lines.

(ලකුණු 10යි)

06. පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසී වාක්‍ය හෝ සිංහලට පරිවර්තනය කරන්න.
පින්වරුම් තමිළ් වාක්කියඞ්කළෙ අල්ලතු ආඞ්කිල වාක්කියඞ්කළෙ සිඞ්කළත්තිල් මොළි පෙයර්ක්ක.
Translate the given Tamil/ English sentences into Sinhala.

1. எமது பிரதான உணவு சோறு.
2. நான் எனது நாட்டை மிகவும் நேசிக்கிறேன்.
3. நாம் முதியோரை கண்ணியப்படுத்துவோம்.
4. கல்வி ஒரு மனிதனை பூரணமாக்கும்.
5. எனது பாடசாலை ஒரு பெரிய பாடசாலையாகும்.

1. Rice is our main staple food.
2. I love my country very much.
3. Let's respect our elders.
4. Education melees a full man.
5. My school is a big school.

(ලකුණු - 2 x 5 = 10යි)

තැතහොත්

ඖෂධීය ෆාමසියේ වෙළඳසැල් හිමියා හා බෙහෙත් ලබා ගැනීමට ගිය භාතිය අතර ඇති වූ කතාව සංවාදයක් ආකාරයට සකස් කරන්න.
කීපේ කාට්ටප්පට්ටුල්ල විටයඟ්කළෙප් පයන්පටුත්ති උරෙයාටල් වටිවිල් එළුතුක.

1. ආමන්ත්‍රණය
2. ලබා ගැනීමට ගිය බෙහෙත පිළිබඳ වෙළඳසැල් හිමියාගෙන් විමසීම
3. නොමැති බව ප්‍රකාශ කිරීම
4. සහන ෆාමසියට යන මග විමසීම
5. ස්තුති කිරීම

(ලකුණු 10යි)

පළමු වාර පරීක්ෂණය - 2018
දෙවන බස සිංහල - 10 ශ්‍රේණිය
කොටස I - පිළිතුරු පත්‍රය

1.	2	11.	4	21.	2	31.	4
2.	2	12.	1	22.	3	32.	2
3.	4	13.	3	23.	2	33.	3
4.	2	14.	2	24.	3	34.	3
5.	2	15.	3	25.	2	35.	1
6.	1	16.	1	26.	2	36.	3
7.	3	17.	2	27.	2	37.	2
8.	4	18.	4	28.	4	38.	2
9.	3	19.	4	29.	2	39.	4
10.	4	20.	3	30.	1	40.	2

(ලකුණු - 1 x 40 = 40 යි.)

II පත්‍රය
I කොටස

01. රචනාව සඳහා ලබාදෙන උපරිම ලකුණු 20 කි.

(අ) අදහස්වලට - ලකුණු 06 යි
- මාතෘකාව ගැන සලකා තිබීම
- කරුණු වල සාරවත් බව
- ප්‍රමාණවත් බව

(ආ) රචනා රීතිය හා සංවිධානය - ලකුණු 10 යි
- ඡේද බෙදා ලිවීම හා ඒවායේ ගැළපීම
- සුදුසු වචන හා වාක්‍යාංශ යොදා තිබීම
- නිර්මාණාත්මක බව
- නිවැරදි වචන භාවිතය (වැරදි ලෙස ලියා ඇති එක් වචනයට එක් ලකුණ බැගින් උපරිමය ලකුණු 05 කට සීමා කොට ලකුණු අඩු කරන්න.

(ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු 4 යි
ව්‍යවහාරික සරල වියරණ රීති රැකීම, පැහැදිලි අත්අකුරු පද බෙදීම, විරාම ලකුණු
(මුළු ලකුණු - 20 යි)

02. අපේක්ෂිත පිළිතුරු
1. වෛද්‍යවරයෙක් ළමයෙකුගේ ඇස් පරීක්ෂා කරන බව
2. ගෘහ භාණ්ඩ කිහිපයක් තිබෙන බව
3. රාක්කයේ බෙහෙත් තිබෙන බව
4. වෛද්‍යවරයා හා ළමයා අතර තවත් අයෙකු සිටින බව
5. මේ ලාම්පුව වෙදනලාව තිබෙන බව

ඉහත කරුණු ඇතුළත්ව ලිඛිත භාෂාවෙන් ලියා ඇති එක් වාක්‍යකට ලකුණු 02 බැගින් ලකුණු 10 යි
(මුළු ලකුණු - 10යි)

II කොටස

03. 1. බසය
2. කුරුටු ගෑම / ඉරිඇඳීම / අසුන් කඩා බිඳ දැමීම
3. පුංචි ළමයින්ට
4. මුතු ඇමුණුවා වාගෙයි මුතු පොටකට
5. 1. පේළි 2. අසුන් (ලකුණු - 2 x 5 = 10 යි.)

04. 1. පුංචි මැටිගෙයක
2. සාමා, විමල්
3. අත්තම්මා
4. දෙමහල් මැදුරක්
5. 1. මන්දිරය 2. ගස (ලකුණු - 2 x 5 = 10 යි.)

III කොටස

05. (අ) පෞද්ගලික ලිපිය :

- (අ) ආකෘතිය - ලකුණු. 4 යි
  (ආ) අන්තර්ගතය - ලකුණු. 4 යි
  (ඇ) ශිල්පීය දක්ෂතා - ලකුණු. 2 යි
- දිනය සහිත යවන්නාගේ ලිපිනය, ආශිර්වාදය, ආමන්ත්‍රණය, අවසානය
- ආන්තර්ගතය - ලකුණු. 4
  - තොරතුරු විමසීම
  - අධ්‍යාපන චාරිකාවන් යන බව දැන්වීම
  - මුදල් ඉල්ලීම
- ශිල්පීය දක්ෂතා - ලකුණු. 2 යි.
  පැහැදිලි අත් අකුරු - පද බෙදා ලිවීම - විරාම ලක්ෂණ භාවිතා ආදි කරුණු සමස්තයක් ලෙස ලියා තිබීම.

නැතහොත්

ආරාධනා පත්‍රය :

- පාසලේ නම
- ප්‍රදර්ශනය පවත්වන තැන
- ස්ථානය, දිනය
- වෙලාව
- දන්වන්නේ කවුද
- දන්වන දිනය

06. පරිවර්තනය

1. බත් අපේ ප්‍රධාන ආහාරයයි.
2. මම මගේ රටට ගොඩක් ආදරෙයි.
3. අපි වැඩිහිටියන්ට ගරු කරමු.
4. ඉගෙනීම මිනිසා සම්පූර්ණ කරයි.
5. මගේ පාසල ලොකු පාසලක් (මුළු ලකුණු - 10 යි)

නැතහොත්

සංවාදය

පහත සඳහන් තොරතුරු වලට අදාලව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

1. අමාත්ත්‍රණය
2. ලබා ගැනීමට ගිය බෙහෙත පිළිබඳව වෙළඳ සැලේ හිමිකරුගෙන් විමසීම
3. බෙහෙත නොමැති බව ප්‍රකාශ කිරීම
4. සහන ෆාමසියට මග විමසීම
5. ස්තුති කිරීම. (මුළු ලකුණු - 10 යි)

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න



| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න